# UNIVERSITY OF PERADENIYA

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2022
கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் – 2022
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level –2022**

**ECNE 202: සාර්ව ආර්ථික න්‍යාය**

කාලය පැය (03) කුනයි.
மூன்று) 03) மணித்தியாலங்கள்
Time: three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ඇත.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
**05 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.**
Answer **05** questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 07 කි
**இந்த வினாப்பத்திரத்தில் 07 வினாக்கள் உள்ளன.**
There are 07 questions in the question paper.

---

1 a) සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

b) සාර්ව ආර්ථික විද්‍යාවේ මූලික අරමුණු විස්තර කර ඒවා අතර පැවතිය හැකි හුවමාරුවීම් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. a) සමාහාර ඉල්ලුමේ ගුණක හා පොලී අනුපාත සංවේදීතාව IS වක්‍රයේ බෑවුමට බලපාන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 06)

b) IS-LM ආදර්ශය භාවිත කරමින් සමාහාර ඉල්ලුම් වක්‍රය (AD) ව්‍යුත්පන්න කර එය විස්තර කරන්න. (ලකුණු 08)

c) දිගුකාලීන සමාහාර සැපයුම් වක්‍රය සිරස්ව හා කෙටිකාලීන සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන ලෙස පිහිටන්නේ ඇයි යන්න විස්තර කරන්න. (ලකුණු 06)

3. a) සමාහාර ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම්ව පවතින්නේ ඇයි? ඔබේ පිළිතුර කිටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

b) 'මිළ මට්ටමේ වෙනසක් මගින් සමාහාර වියදම් වක්‍රය විතැන් වුවද සමාහාර ඉල්ලුම් වක්‍රය විතැන් නොවේ'. මෙම ප්‍රකාශනය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

c) සමාහාර සැපයුම් වක්‍රයේ හැඩය විස්තර කරමින් ඉහලට බෑවුම්වන සමාහාර සැපයුම් වක්‍රයක ගුණක බලපෑම දුර්වල වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 07)

4. a) පරිභෝජන න්‍යායේ ජීවන චක්‍ර උපන්‍යාසය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 10)

b) පරිභෝජන න්‍යායන් වන නිරපේක්ෂ අදායම් හා ස්ථාවර අදායම් උපන්‍යාසය පිලිබදව සංසන්දනාත්මක ඇගයිමක් කරන්න. (ලකුණු 10)

5 a) උද්ධමනය පිළිබඳ ඉල්ලුමෙන් ඇදුනු න්‍යායට අනුව ආර්ථිකයට ඉහළ මට්ටමේ නිමැවුම් හා සේවා නියුක්තියක් ලබා ගැනීම සඳහා යම් මට්ටමක උද්ධමනයක් අවශ්‍ය විය හැකිය. කෙසේ වෙතත්, උද්ධමනය පිළිබඳ පිරිවැයෙන් තල්ලු වූ න්‍යායෙන් ඇඟවෙන්නේ මූර්ත නිෂ්පාදනය හා සේවා නියුක්තිය පහත වැටීමත් සමඟ උද්ධමනය සිදුවිය හැකි බවයි. මෙම ප්‍රකාශයට ඔබ එකඟ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

b) විරැකියාව ප්‍රශ්නයක් ලෙස සලකන්නේ ඇයි? මෙම ගැටළුව විසඳීම සඳහා භාවිතා කළ හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 10)

6. a) AD හා AS වක්‍ර භාවිතයෙන් ප්‍රසාරනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් මගින් අදායම් මට්ටම හා සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි ඇති කරන කෙටිකාලීන හා දිගුකලීන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

b) AD හා AS වක්‍ර භාවිතයෙන් ප්‍රසාරනාත්මක පිස්කල් ප්‍රතිපත්තියක් මගින් අදායම් මට්ටම හා සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි ඇති කරන කෙටිකාලින හා දිගුකලීන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

7. පහත සඳහන් ඒවායින් ඕනෑම හතරකට කෙටි සටහන් ලියන්න.

a. ද්‍රවශීලතා පාශය

b. තෙරපිමේ ප්‍රතිවිපාකය

c. මුදල් සඳහා සමපේක්ෂණ ඉල්ලුම

d. පිලිප්ස් වක්‍රය

e. ගුණාත්මක හෝ වරණාත්මක ණය පාලන ක්‍රම

(එක් කොටසකට ලකුණු 5යි)